කෝට්ටේ නාවල බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනියට හා දෙමාපිය පිරිසකට, වැලිකඩ පොලිසියේදී ලිංග ප්‍රදේශය පෙන්වීමෙන් ලිංගික අතවරයක් සිදු කළ බවට චෝදනා ලැබූ හිටපු නාගරික මන්ත්‍රී කෙනෙකු රිමාන්ඩ් කිරීමේ සිදුවීම, පුවත්පත් කිහිපයකම වාතර්ා වී තිබුණේ මේ ආකාරයටය.

* "පොලිසිය ඇතුළේ විදුහල්පතිනියකට කැත වැඩක් කළ හිටපු නාගරික මන්ත්‍රී රිමාන්ඩ්" (ලිංගේන්ද්‍රිය පෙන්වා ලිංගික අතවර කිරීමක් ලෙසින් අන්තගර්තයේ සඳහන් වේ). - දිනමිණ

* "විදුහල්පතිනියට නිරුවත පෙන්වීයැයි කෝට්ටේ නාගරික මන්ත්‍රී රිමාන්ඩ්" - මව්බිම

* "විදුහල්පතිනියට නිරුවත පෙන්වූ කෝට්ටේ නාගරික මන්ත්‍රී රිමාන්ඩ්" - ලංකාදීප

* "වැලිකඩ පොලිසියේදී විදුහල්පතිනියට නිරුවත පෙන්වූ හි.පොහොට්ටු නාගරික මන්ත්‍රී රිමාන්ඩ්" - අද

ඔබ සිතන ලෙසට,

1) නීතියෙන් දඬුවම් ලැබෙන වරදක් වන, සිය ලිංගික ප්‍රදේශ පෙන්වීමෙන් ලිංගික අතවර කිරීමක්, "කැත වැඩක්" කිරීමක් ලෙසින් දැක්වීම ඔස්සේ, දිනමිණ සිරස්තලය මෙම අපරාධය සැහැල්ලු කොට දක්වා නැතිද? ඒ ඔස්සේ මෙවැනි වරද සමාජය තුළ සාමාන්‍ය දෙයක් බවට පත් වීමේ අවදානමක් නොමැති ද?

2) දිනමිණ සිරස්තලය මෙය "කැත වැඩක්" ලෙසින් දැක්වූවද, දිනමිණ පුවත් අන්තගර්තයේ එය "ලිංගේන්ද්‍රිය පෙන්වා ලිංගික අතවර කිරීමක්" ලෙසින් දැක්වෙන්නේ, පුවතට සිරස්තල යොදා ඇත්තේ පුවත ලියූ මාධ්‍යවේදියා විසින් නොව වෙනත් කතර්ෘවරයෙකු විසින් වීම නිසා ද?

3) ඒ අනුව, මෙම පුවතම වාතර්ා කරනා මව්බිම, ලංකාදීප සහ අද පුවත් සිරස්තල, මෙම සිදුවීම සැහැල්ලු නොකොට, වඩාත් නිවැරදිව දක්වා ඇතැයි ඔබ නොසිතන්නේ ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධමර් කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!